අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ

# සිංහල

## විෂය නිර්දේශය

(2009 වර්ෂයේ සිට ක්‍රියාත්මකයි.)

## 12 වන ශ්‍රේණිය සහ 13 වන ශ්‍රේණිය

සිංහල දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## 1.0 හැඳින්වීම

සන්නිවේදනයේ ප්‍රබලතම මාධ්‍යය වන භාෂාව මානවයාගේ විශිෂ්ටතම නිර්මාණයකි. සමාජයක් සිය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ඒ සමාජය විසින් පිළිගත් සම්මතයට අනුව ව්‍යවහාර කරන වාගාලාපවලින් යුත් ප්‍රපංචයක් ලෙස භාෂාව සැලකේ. මිනිසාගේ චින්තනයට ඉවහල් වනුයේ ද භාෂාව ය. භාෂාව ජාතික අනන්‍යතාව හෙළි කරන සංකේතයක් ද වේ. මිනිසාගේ ප්‍රජානන ක්ෂේත්‍රයේ නිම්වළලු පුළුල් කර ගැනීමේ ලා භාෂාවේ වියරණය ඇතුළු ශාස්ත්‍රීය අංශයේ කාර්යභාරය අතිමහත් ය.

එමෙන් ම භාෂාව උපයෝගී කොට ගෙන සාහිත්‍යය නිර්මාණය වී ඇත. භාෂාව හා සාහිත්‍යය යන්න එකිනෙකට වෙන් කළ නොහැකි සේ අවියෝජනීය ලෙස බැඳී පවතී. භාෂාවෙන් තොර සාහිත්‍යයක් ද සාහිත්‍යයෙන් තොර භාෂාවක් ද නොමැත. සාහිත්‍යය මිනිස් ජීවිතය හා බැඳී පවත්නා උත්තම ගණයේ කලා අංගයකි. එය බහුල වශයෙන් ජීවිතයට සම්බන්ධ වන්නේ නිර්මාණය, ආස්වාදය හා විචාරය යන ත්‍රිත්වය ම එයට සුසංයෝගී වන බැවිනි. සාහිත්‍යය මිනිස් හදවත් තුළ ආස්වාදනීය හැඟීම් පුබුදු කර සංවේදී මනසක් ජනිත කරලීමට සමත් ය. ඒ නිසා භාෂාව හා සාහිත්‍යය යන අංශ දෙක ම සුසංයෝගී වූ මෙම විෂය නිර්දේශ මගින් සංවේදී හදවතක් සහිත නිර්මාණශීලී පුද්ගලයකු සමාජයට බිහිකරලීම අපේක්ෂා කෙරේ.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව නිපුණතා පාදක විෂය මාලාවක් පාසල් පද්ධතියට හඳුන්වා දී ඇත. ඒ අනුව අ.පො.ස. (උ.පෙළ) සිංහල විෂය නිර්දේශය සඳහා ද ප්‍රධාන නිපුණතා 13 ක් යටතේ භාෂාව හා සාහිත්‍යයට අදාළ විෂය සන්ධාරය ඉදිරිපත් කර ඇත. එම නිපුණතා සාක්ෂාත් වන පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම අපේක්ෂිත ය.

මෙම නව විෂය නිර්දේශය හඳුන්වාදීම මගින් බලාපොරොත්තු වනුයේ නව අධ්‍යාපන සංකල්පවලට ශිෂ්‍යයා යොමු කිරීමයි. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය නවීකරණය කොට ශිෂ්‍ය සාධනය මැන බැලීමේ දී නිපුණතා පාදක අධ්‍යාපනයක් ලබා දීමටත් අවශ්‍ය යෝජනා මෙම විෂය නිර්දේශය මගින් ඉදිරිපත් කර ඇත.

තොරතුරු තාක්ෂණය (Information Technology ) හා පෘථුල වූ සන්නිවේදන ජාලය වැනි විවිධ වූ නූතන තාක්ෂණික මෙවලම් හේතුවෙන් සන්නිවේදන ක්‍රියාවලිය වේගවත් වී ඇත. සන්නිවේදන තාක්ෂණයේ දියුණුව නිසා නිවැරදි භාෂා භාවිතය අද ඉතා අවශ්‍ය වී ඇත. නිවැරදි ව භාෂාව භාවිතය සඳහා යොමු කිරීමත්, සම්භාව්‍ය සාහිත්‍ය කෘති මෙන් ම පිළිගත් ලේඛන, නූතන ගද්‍ය පද්‍ය සාහිත්‍ය නිර්මාණ පරිශීලනය මගින් සංවේදී බවට පත් කිරීමත් ගුරුවරුන් පමණක් නොව ගුරුභවතුන්ගේ ද කාර්යභාරය වනු ඇත.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙන් ම විෂය සමගාමී කටයුතුවල දී ද සාහිත්‍ය රසඥතා වර්ධනයට හා භාෂා සංකල්ප සංවර්ධනයට ගුරු පරපුරේ අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත. ඔබේ ඉගැන්වීම් ක්‍රියාවලිය නවීකරණය කර ගැනීම සඳහාත් ශිෂ්‍ය ඉගෙනුම් ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහාත් මෙම විෂය නිර්දේශය මනා පිටිවහලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 2.0 විෂය නිර්දේශයේ අරමුණු

1. සන්නිවේදන නිපුණතා වර්ධනය කර ගැනීම.
2. ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක ලේඛනවල ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම.
3. සම්භාව්‍ය සිංහල සාහිත්‍ය කෘති පරිශීලනය කිරීමෙන් මානව සමාජ සංස්කෘතික අගයන් අවබෝධ කර ගැනීම, අත්පත් කර ගැනීම හා ජීවිත පරිඥානය ලබා ගැනීම.
4. වින්දනාත්මක, නිර්මාණාත්මක හා විචාරාත්මක වර්ධනය කර ගනිමින් රසාස්වාදයට යොමු වීම.
5. භාෂා අධ්‍යයනය මගින් ජාතික අනන්‍යතාව ගොඩ නගා ගැනීම හා සාමකාමී සහජීවනයට හුරු වීම.
6. වර්ධනය වන්නාවූත් ව්‍යාප්ත වන්නාවූත් සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි භාෂා කුසලතා වර්ධනය කර ගැනීම.
7. වර්ධනය කර ගත් භාෂා දැනුම හා භාෂා කුසලතා, ඉගෙනීමට ඉගෙනීම සඳහා යොදා ගැනීම.
8. භාෂා සාහිත්‍ය පරිශීලනය මගින් ස්වීයත්වය හා භාෂා මාමකත්වය වර්ධනය කර ගැනීම.

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද |
|---|---|---|---|
| 12 | 1 | 1.1, 1.2, 2.1, 2.2, 3.1, 3.2, 4.1, 4.2, 5.1, 6.1, 6.2, 6.4, 7.5, 7.6 | 100 |
| | 2 | 1.3, 2.2, 2.3, 2.4, 3.2, 3.4, 4.3, 5.2, 5.3, 6.2, 6.3, 6.4, 6.5, 7.4, 7.5, 7.6, 7.7, 7.8, 7.9 | 100 |
| | 3 | 1.3, 2.3, 2.4, 3.2, 3.3, 3.4, 3.5, 4.3, 5.2, 5.3, 6.4, 6.5, 7.5, 7.6, 7.7, 7.8, 7.9 | 100 |
| 13 | 1 | 1.1, 2.1, 3.1, 3..2, 4.1, 4.2, 5.1, 5.2, 6.3, 7.5, 7.6, 7.7, 7.8, 7.9 | 100 |
| | 2 | 1.2, 2.2, 3.1, 3.2, 4.1, 4.2, 5.1, 5.2, 6.3, 6.4, 7.5, 7.6, 7.7, 7.9 | 100 |
| | 3 | 1.2, 2.3, 3.1, 3.2, 4.1, 4.2, 5.1, 5.2, 6.4, 7.5, 7.6, 7.7, 7.9 | 100 |

## 3.0 විෂය නිර්දේශය

### 3.1 12 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 1. නවකතා හා නවකතා මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව මළගිය ඇත්තෝ නවකතාව විචාරයට ලක් කරයි | 1.1 නවකතාවක මූලික ලක්ෂණ විස්තර කරයි<br>1.2 සිංහල නවකතාවේ ආරම්භය හා විකාසය පැහැදිලි කරයි<br>1.3 නවකතාංග කෙරෙහි අවධානය යොමු කරමින් මළගිය ඇත්තෝ නවකතාව විචාරය කරයි. | • මළගිය ඇත්තෝ<br>මහාචාර්ය එදිරවීර සරච්චන්ද්‍ර<br>• නවකතාව නම් සාහිත්‍යාංගය හඳුනා ගැනීම<br>• සිංහල නවකතා කලාවේ ආරම්භය හා විකාසය<br>• මළගිය ඇත්තෝ නවකතාවේ තේමාව හා කතා වස්තුව හඳුනා ගැනීම<br>• නවකතාවේ සන්දර්භය වටහා ගැනීම | 40 |
| 2. සංස්කෘත නාට්‍ය මූලධර්ම හඳුනාගෙන රත්නාවලී නාට්‍යය රස විඳියි | 2.1 සාහිත්‍යාංගයක් ලෙස නාට්‍ය කලාවේ සුවිශේෂතා විස්තර කරයි<br>2.2 රත්නාවලී නාට්‍යයේ පෙළ කියවා අවබෝධ කර ගනියි<br>2.3 රත්නාවලී නාට්‍යයේ චරිත පිළිබඳ විග්‍රහයක යෙදෙයි<br>2.4 නාට්‍ය විචාර මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතුව රත්නාවලී නාට්‍යය විචාරය කරයි | • රත්නාවලී<br>පරිවර්තනය - පියදාස නිශ්ශංක<br>• නාට්‍ය කලාව හඳුනා ගැනීම<br>• රත්නාවලී නාට්‍ය පෙළ<br>• රත්නාවලී නාට්‍යයේ චරිත නිරූපණය<br>• රත්නාවලී නාට්‍යය රස විඳීම | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 3. පුරාතන ගද්‍ය සාහිත්‍ය පරිශීලනයෙන් ලබා ගත් ජීවිත පරිඥානය හා භාෂා පරිචය නිර්මාණාත්මක භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි | 3.1 පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ස්වභාවය පැහැදිලි කරයි<br>3.2 නිර්දිෂ්ට කතාවන්හි දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කරයි<br>3.3 සද්ධර්මරත්නාවලියේ අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීතිය හඳුනාගෙන විග්‍රහ කරයි<br>3.4 පන්සිය පනස් ජාතක පොතෙහි අන්තර්ගතය භාෂා ලක්ෂණ හා රචනා රීතිය හඳුනාගෙන විග්‍රහ කරයි<br>3.5 සද්ධර්මාලංකාරයෙහි අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීතිය හඳුනාගෙන විග්‍රහ කරයි | • පුරාතන ගද්‍ය<br>• පුරාතන ගද්‍ය සාහිත්‍යය හැඳින්වීම.<br>• දුරවබෝධ වචනවල අර්ථ<br>• සද්ධර්මරත්නාවලිය ග්‍රන්ථය, කතුවරයා, යුගය<br>පටාචාරා වහන්දෑගේ වස්තුව<br>• පන්සිය පනස් ජාතක පොත සහ යුගය<br>ඡද්දන්ත ජාතකය<br>ගණ්ඩතින්දු ජාතකය<br>• සද්ධර්මාලංකාරය කතුවරයා සහ යුගය<br>සාලිරාජ වස්තුව | 40 |
| 4. ගිරා සන්දේශය පරිශීලනය කරමින් සන්දේශ සාහිත්‍යය පිළිබඳ විමර්ශනයක යෙදෙයි | 3.1 සන්දේශ කාව්‍ය සාහිත්‍යයේ ස්වභාවය පැහැදිලි කරයි<br>3.2 සන්දේශ කාව්‍යයක ආකෘතික ලක්ෂණ ඉදිරිපත් කරයි<br>3.3 ගිරා සන්දේශය පරිශීලනය කරමින් රසාස්වාදයේ යෙදෙයි | • ගිරා සන්දේශය<br>• කෝට්ටේ සාහිත්‍ය යුගය<br>• සන්දේශ කාව්‍ය<br>• ගිරා සන්දේශයේ ආකෘතික ලක්ෂණ<br>• අර්ථාවබෝධය හා රසාස්වාදය (දූත වර්ණනාවේ සිට අම්බලමේ කතා අවසානය දක්වා) | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 5. කෙටිකතා මාධ්‍ය හා එහි ලක්ෂණ ගවේෂණය කරමින් කෙටිකතා සාහිත්‍යය පිළිබඳ විමර්ශනයක යෙදෙයි | 5.1 කෙටිකතා කලාව පිළිබඳ ව විචාරවත් බවක් පළ කරයි<br><br>5.2 නිර්දිෂ්ට කෙටිකතා විචාරය කරයි<br><br>5.3 කෙටිකතා කියවීමෙන් ලබා ගත් දැනුම නිර්මාණාත්මක භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි | • කෙටිකතා<br>• කෙටිකතා ඉතිහාසය හා මූලධර්ම<br>• සිංහල කෙටිකතාවේ ආරම්භය හා විකාසය<br>• **පුරුද්ද** - ඩබ්ලිව්.ඒ. සිල්වා<br>• **මුදියන්සේ මාමා** - මාර්ටින් වික්‍රමසිංහ<br>• **තාත්තා** - ජී.බී. සේනානායක<br>• **සාක්කි තුනක්** - කේ. ජයතිලක<br>• **පුතාගේ ශිෂ්‍යත්වය**-ගුණදාස අමරසේකර<br>• **තමන්ගේ දරුවෝ** - ඒ.වී. සුරවීර<br>• **සත්ගුණවත් සාමෙල් -** මඩවල එස්. රත්නායක<br><br>• කෙටිකතා නිර්මාණය කිරීම | 40 |
| 6. නූතන පද්‍ය සාහිත්‍ය යුග හඳුනාගෙන විචාර සිද්ධාන්තවලට අනුව නිර්දිෂ්ට පද්‍ය පන්ති රසාස්වාදයේ යෙදෙයි | 6.1 නූතන පද්‍ය සාහිත්‍ය ඉතිහාසය පැහැදිලි කරයි<br>6.2 කොළඹ යුගයේ කවියෙහි විවිධතා පැහැදිලි කරයි<br>6.3 සිංහල කවියෙහි නව ප්‍රවණතා ගවේෂණය කරයි<br>6.4 යශෝදරාවතෙහි කාව්‍යමය ගුණය විස්තර කරයි | • නූතන පද්‍ය<br>• නූතන කාව්‍ය සාහිත්‍ය යුග<br>• නූතන කවියේ සුවිශේෂ ලක්ෂණ<br>• සිංහල කවියෙහි නව ප්‍රවණතා<br>• යශෝදරාවත කවි 10ක් (77, 82 සිට 88 තෙක් 100 සහ 102 කවි) | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 6.5 විචාර මූලධර්මවලට අනුව කොළඹ යුගයේ පද්‍ය විචාරය කරයි. | • **පක්ෂි භාෂාව** - ආනන්ද රාජකරුණා<br>• **ජාතික තොටිල්ල** - ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි. (මුල් කවි 10)<br>• **පරලොවට පණිවිඩයක්** - පී.එච්. පෙරේරා<br>• **හිඟන්නා** - කුමාරතුංග මුනිදාස<br>• **වවුල් හමුව** (වවුලුව) - රැයිපියෙල් තෙන්නකෝන්<br>• **අන්ධ කවියා** - පී.බී. අල්විස් පෙරේරා<br>• **පරිණාමා** - සාගර පලන්සූරිය<br>• **හේරත්හාමි** - විමලරත්න කුමාරගම<br>• **රුව දැකීම**-පී.බී. සේනානායක<br>• **කතරගම**- ගුණදාස අමරසේකර<br>• **දිවා භෝජනය**- සිරි ගුනසිංහ | |
| 7. අක්ෂර, පද, වචන, වාක්‍ය ආදී භාෂාංග පිළිබඳ නිවැරදි අවබෝධයෙන් භාෂාව හසුරුවමින් විවිධ ලේඛන කටයුතුවල යෙදෙයි | 7.1 අක්ෂර මාලාව පිළිබඳ නිවැරදි අවබෝධය ප්‍රදර්ශනය කරයි<br>7.2 අක්ෂර වින්‍යාස රීති පිළිබඳ මනා අවබෝධයක් සහිතව නිවැරදි ව බස හසුරුවයි<br>7.3 අකාරාදි පිළිවෙළ පිළිබඳ දැනුම ප්‍රායෝගික අවස්ථාවන් සඳහා යොදා ගනියි<br>7.4 සන්ධි විධි පිළිබඳ ව අවබෝධයෙන් ප්‍රායෝගික සන්ධි රීති පැහැදිලි කරයි | • සිංහල අක්ෂර මාලාව<br>• අක්ෂර ප්‍රභේද<br>• අක්ෂර වින්‍යාසය<br>• අකාරාදි පිළිවෙළ<br>• ප්‍රායෝගික සන්ධි රීති | 60 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 7.5 තර්කානුකූල ව හා විචාරශීලී ව කරුණු සංවිධානය කර ගනිමින් නිර්මාණාත්මක වාක්‍ය රචනා කරයි | • වාක්‍ය රචනය<br>දෙනු ලබන මාතෘකාවලින් එකක් ගැන අර්ථවත් හා සාරවත් කරුණු, සංවිධානාත්මක ව නිර්මාණාත්මක ව හා පැහැදිලි ව ව්‍යක්ත ව්‍යවහාරයෙන් යුතු ව ඉදිරිපත් කිරීම අපේක්ෂිත ය<br>**අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර**<br>සංස්කෘතිය හා කලා ශිල්ප<br>කාලීන ජාතික හා ජාත්‍යන්තර<br>සමාජ ආර්ථික, දේශපාලනික හා<br>අධ්‍යාපනික ප්‍රවණතා,<br>ජාතික උරුමය<br>තොරතුරු තාක්ෂණය හා<br>සන්නිවේදනය<br>නාට්‍ය හා සිනමා කලාව<br>සාහිත්‍ය හා කලා විචාරය<br>නිර්මාණාත්මක ලේඛන | |
| | 7.6 විවිධ ගද්‍ය පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගනියි | • අවබෝධය හා සාරාංශකරණය<br>අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගතය අවබෝධය | |
| | 7.7 සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් සාරාංශකරණයේ යෙදෙයි | • සාරාංශකරණය<br>අනිර්දිෂ්ට ගද්‍ය පාඨයක් සාරාංශ කිරීම | |
| | 7.8 ලේඛනයේ දී පද සාධනය හා පද භාවිතය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි | • නාම පද<br>නාම ප්‍රකෘති | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | උපසර්ග හා ප්‍රත්‍යය<br>(නියත/අනියත)<br>විභක්ති (උක්ත/අනුක්ත රූප)<br>සංඛ්‍යා, (ඒක/ බහු)<br>තද්ධිත හා කෘදන්ත<br>• නාම ප්‍රභේද<br>නාම නාම<br>සර්ව නාම (පුරුෂ භේදය)<br>සමාස නාම<br>ප්‍රත්‍යාර්ථ නාම<br>(තද්ධිත නාම හා කෘදන්ත නාම)<br>• නාම වරනැගීම (ලිංග, සංඛ්‍යා, නියත අනියත, විභක්ති වශයෙන් )<br>• ක්‍රියා පද<br>• **ක්‍රියා ප්‍රභේද**<br>**අවසාන ක්‍රියා - අනවසාන ක්‍රියා**<br>**අවසාන ක්‍රියා**<br>ශුද්ධ ක්‍රියා,<br>ආශිර්වාද ක්‍රියා (ප්‍රාර්ථනා ක්‍රියා)<br>විධි ක්‍රියා,<br>ප්‍රයෝජ්‍ය ක්‍රියා<br>**අනවසාන ක්‍රියා**<br>පූර්ව ක්‍රියා,<br>අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා,<br>අසම්භාව්‍ය ක්‍රියා, භාව ක්‍රියා<br>ශුද්ධ ක්‍රියා<br>ශුද්ධ ආඛ්‍යාත, නාම ආඛ්‍යාත<br>**කාල භේදය**<br>අතීත, අනතීත (වර්තමාන හා අනාගත)<br>**සංඛ්‍යා භේදය**<br>ඒකවචන, බහුවචන | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 7.9 සම්මත රීති අනුගමනය කරමින් නිවැරදි වාක්‍ය නිර්මාණය කරයි | **පුරුෂ භේදය**<br>ප්‍රථම, මධ්‍යම, උත්තම<br>**ආකෘති භේදය**<br>ආත්මනෙ පද, පරස්මෙ පද<br>• විශේෂණ පද<br>නාම විශේෂණ පද<br>ක්‍රියා විශේෂණ පද<br>• **අව්‍යය පද**<br>නිපාත හා උපසර්ග<br><br>• **වාක්‍ය සාධනය**<br>• වාක්‍ය ප්‍රභේද<br>සරල වාක්‍ය<br>ද්විත්ව උක්ත සහිත වාක්‍ය<br>ද්විත්ව කර්ම සහිත වාක්‍ය<br>සංහත වාක්‍ය<br>සංකීර්ණ වාක්‍ය<br>ප්‍රශ්න වාක්‍ය<br>නිශේධන වාක්‍ය<br>අන්තර් වාක්‍ය<br>අවයව වාක්‍ය<br>උප වාක්‍ය<br>වාක්‍යාංශ<br>පදාංශ<br>• උක්තාඛ්‍යාත පද සම්බන්ධය<br>උක්ත අනුක්ත භේදය | |

3.2 13 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 1. නවකතා පරිශීලනයෙන් ලබන අත්දැකීම් එදිනෙදා ජීවිතය සඳහා ප්‍රායෝගික ව යොදා ගනියි | 1.1 මළගිය ඇත්තෝ නවකතාවේ දෘෂ්ටිය හා චරිත නිරූපණය විචාරාත්මක ව දකියි<br>1.2 සමකාලීන සිංහල නවකතා අතර මළගිය ඇත්තෝ නවකතාවේ සුවිශේෂතා හඳුනා ගනියි | • මළගිය ඇත්තෝ නවකතාවේ ජීවන දෘෂ්ටිය හා චරිත නිරූපණය<br>• මළගිය ඇත්තෝ නවකතාව සමකාලීන නවකතා සමග සන්සන්දනය | 48 |
| 2. පුරාතන ගද්‍ය සාහිත්‍ය ඇසුරුකරමින් තම රසඥතාව පුළුල් කර ගනියි | 1.1 සද්ධර්මරත්නාවලියේ අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීතිය හඳුනාගෙන විග්‍රහ කරයි<br>1..2 පන්සිය පනස් ජාතක පොතෙහි අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීතිය හඳුනාගෙන විග්‍රහ කරයි<br>1.3 සද්ධර්මාලංකාරය අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීතිය හඳුනාගෙන විග්‍රහ කරයි | • සද්ධර්ම රත්නාවලිය<br>• මච්ඡරියකෝසිය සිටාණන්ගේ වස්තුව<br>• පන්සිය පනස් ජාතක පොත<br>• සම්බුලා ජාතකය<br>• දේවධර්ම ජාතකය<br>• සද්ධර්මාලංකාරය<br>• ආරක්ඛදක අභය ස්ථවිර වස්තුව | 48 |
| 3. සිංහල සන්දේශ සාහිත්‍යය ඇසුරෙන් තම රසඥතාව, විචාර හැකියාව නිර්මාණාත්මක කුසලතා ප්‍රදර්ශනය කරයි | 3.1 ගිරා සන්දේශය පරිශීලනය කරමින් රසාස්වාදයේ යෙදෙයි<br>3.2 ගිරා සන්දේශය පරිශීලනයෙන් ලබා ගන්නා අත්දැකීම් නිර්මාණකරණය සඳහා යොදා ගනියි | • ගිරා සන්දේශය<br>• මඟ වැනුමේ සිට අවසානය දක්වා<br>• නිර්මාණකරණය | 48 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 4. නූතන පද්‍ය සාහිත්‍යයෙහි විවිධතා කෙරෙහි අවධානය යොමු කරමින් නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ රස විඳියි | 4.1 විචාර මූලධර්මවලට අනුව කොළඹ යුගයේ පද්‍ය රස විඳියි<br><br>4.2 කාව්‍ය නිර්මාණකරණයෙහි යෙදෙයි | • පද්‍ය<br>• **පිතෘත්වය** - විමල් දිසානායක<br>• **අම්මා** - මහගමසේකර<br>• **දියණියනි** - මොනිකා රුවන්පතිරණ<br>• **දෙදෙනාම දියණියෝ** - බුද්ධදාස ගලප්පත්ති<br>• **මිතුරන් දෙදෙනා සහ පොරොව** - පරාක්‍රම කොඩිතුවක්කු<br>• **එතෙර ගිය පොඩි දුවට** - දයාසේන ගුණසිංහ<br>• **ගුරුපියාණනි** - කෝ. ආනන්ද හිමි<br>• **වංකගිරියට මාරුවීම** - රත්න ශ්‍රී විජේසිංහ<br>• **ගේ කුරුල්ලෝ සහ වී කුරුල්ලෝ** - ආරියවංශ රණවීර<br>• **සුරා සොඬ සැමි වලප** - යමුනා මාලනී පෙරේරා<br>• **වලව්වට වැසි ඇවිත්** - නන්දන වීරසිංහ<br>• **ලීස්තර වැට** - එරික් ඉලයප්ආරච්චි<br>• කාව්‍ය නිර්මාණය කිරීම | |
| 5. විචාර මූලධර්මවලට අනුගත ව කෙටිකතා විචාරය කරයි | 5.1 නිර්දිෂ්ට කෙටිකතා විචාරය කරයි | • **කොළඹ ගමන**-සෝමරත්න බාලසූරිය<br>• **අපේක්ෂා**- පියසීලී විජේමාන්න<br>• **තාත්තාගේ මළගම** -ජයතිලක කම්මැල්ලවීර<br>• **මාවතේ දරුවෝ**- දයාසේන ගුණසිංහ<br>• **ප්‍රදීපාගාරය යට**- රංජිත් ධර්මකීර්ති | 48 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 5.2 කෙටිකතා කියවීමෙන් ලබාගන්නා දැනුම නිර්මාණාත්මක භාෂා කාර්යයන් සඳහා උචිත ලෙස යොදා ගනියි | • කෙටිකතා නිර්මාණය | |
| 6. විචාර මූලර්ධවලට අනුගත ව නිවැරදි ව හා නිරවුල් ව බස හසුරුවමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි | 6.1 තර්කානුකූල ව හා විචාරශීලී ව කරුණු සංවිධානය කරගනිමින් නිර්මාණාත්මක වාක්‍ය රචනා ලියයි<br>6.2 සංස්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් සාරාංශකරණයේ යෙදෙයි<br>6.3 සම්මත රීති අනුගමනය කරමින් නිවැරදි වාක්‍ය නිර්මාණය කරයි | • වාක්‍ය රචනය<br>• සාරාංශකරණය<br>• වාක්‍යවල කාරක භේදය<br>කර්තෘ කාරක<br>කර්ම කාරක<br>භාව කාරක<br>ෂට් කාරක<br>• **ජේක ප්‍රයෝග**<br>• **විශේෂ වාක්‍ය රීති**<br>**කථන ව්‍යවහාරයේ සහ ලේඛන ව්‍යවහාරයේ වාක්‍යවල විශේෂතා**<br>• වාංමාලාව<br>සමානාර්ථ වචන<br>විරුද්ධාර්ථ වචන<br>බහ්වර්ථ වචන<br>පාරිභාෂික වචන<br>අනුරූප වචන සංයෝගය (විදේශ ප්‍රවෘත්ති, විදෙස් පුවත්)<br>වාක්‍යාංශයක් වෙනුවට යෙදිය හැකි තනි වචන (නිශාචර, සිවුපා) | 60 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
| --- | --- | --- | --- |
| | | • **භාෂා සම්ප්‍රදාය**<br>රූඪි<br>යුගල වචන<br>ප්‍රස්තාව පිරුළු<br>උප භාෂා (ප්‍රාදේශිය, සමාජීය)<br>• **ශිල්පීය දක්ෂතා**<br>පිලි භාවිතය<br>විරාම ලක්ෂණ<br>පද බෙදීම | |

## 4.0 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

වෙනත් විෂයයන් මෙන් ම සිංහල විෂය ද වරින් වර විවිධ වෙනස්වීම්වලට භාජන වන්නා වූ ගතික බවකින් යුක්ත විෂයයකි. එසේ හෙයින් ඉගෙනුම් ක්‍රම මෙන් ම ඉගැන්වීම් ක්‍රමෝපාය පිළිබඳ ව ද ගුරු භවතුන් අවධානයෙන් සිටීම අවශ්‍ය වේ. ශිෂ්‍යයාට පූර්ණ පුරවැසියකු සේ ජීවත් වීමට අවශ්‍ය නව අත්දැකීම් ලබා දීම ගුරුවරයාගේ කාර්යභාරය යි.

පන්ති කාමරයේ දී ශිෂ්‍යයා ඒකාකාරී ව දේශනයකට සවන් දෙන අකර්මණ්‍ය පුද්ගලයෙකු නොව, දැනුම ගවේෂණය කරන්නා වූ ක්‍රියාකාරී පුද්ගලයකු බවටත්, නව මං පෙත් කරා යා යුතු නිර්මාණශීලී කෙනෙකු බවටත් යොමු වීම සඳහා පෙළඹවිය යුතු ය. එම නිසා සිංහල විෂය උගන්වන ගුරුවරයා විෂය උගන්වන්නෙකු පමණක් නොව සිසුන්ට ඉගෙන ගැනීමට අවශ්‍ය ඉගෙනුම් - ඉගැන්වීම් පරිසරයක් පිළියෙල කර දෙන පහසුකම් සලස්වන්නෙකු (Facilitator) වීම ද යුගයේ අවශ්‍යතාවක් වේ. ඒ සඳහා පහත සඳහන් මග පෙන්වීම් ප්‍රයෝජනවත් වනු ඇත. එහි දී ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී විෂය ඒකකවල ස්වභාවය, ගැටලු අවස්ථා, භාෂා මට්ටම ආදිය සැලකිල්ලට ගෙන යෝග්‍ය පරිදි භාවිතයට ගැනීම අවශ්‍ය වේ.

- දේශන හා සාකච්ඡා
- ස්වයං මෙහෙයුම් අධ්‍යයන ක්‍රම
- බුද්ධි කලම්බනය
- පොතපත පරිශීලනය
- පුස්තකාල පරිහරණය හා ශබ්දකෝෂ භාවිතය
- කණ්ඩායම් ඉගෙනුම් ක්‍රමය
- පැවරුම් හා ව්‍යාපෘති
- සමරූපණය
- භූමිකා රංගනය
- කේවල හෝ සාමූහික ක්‍රියාකාරකම්
- ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතය
- විවාද

ස්වීය චින්තනය ඔස්සේ වෙනත් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපායයන් භාවිතයට ගත හැකි හැම විට ම ගුරුවරයා පහසුකම් සලසන්නෙකු හා නියාමනය කරන්නෙකු ලෙස කටයුතු කිරීම අපේක්ෂා කෙරේ.

## 5.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සඳහා සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය නිර්දිෂ්ට ග්‍රන්ථවලට හා පන්ති කාමරයට පමණක් සීමා නොවිය යුතු ය. තාක්ෂණය හා සන්නිවේදනය පුළුල් ලෙස ව්‍යාප්ත ව ලෝකය ම විශ්ව ගම්මානයක් බවට පත් ව ඇත. එම අභියෝගයන්ට සාර්ථක ව මුහුණ දීම සඳහා භාෂාව ශාස්ත්‍රීය ලෙස හා නිර්මාණාත්මක ව භාවිත කිරීමට සිසු පරපුර යොමු කළ යුතු ව ඇත. එබැවින් භාෂාව හා සාහිත්‍ය සම්බන්ධ ව විෂය සමගාමී කටයුතු කෙරෙහි විශේෂ අවධානයකින් පාසල තුළ විවිධ වැඩසටහන් සංවිධානය වීම ඵලදායී වනු ඇත. කාලච්ඡේද සංඛ්‍යාව, උචිත පරිදි වෙනස් කර ගත හැකි ය.

1. සාහිත්‍ය සංගම්
2. බිත්ති පුවත්පත් සහ සඟරා
3. නාට්‍ය
4. පුස්තකාල පරිහරණය
5. ක්ෂේත්‍ර චාරිකා
6. භාෂා තරග
7. කණ්ඩායම් හා කේවල පැවරුම්
8. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සඳහා විවිධ නිර්මාණ
9. මාධ්‍ය කව
10. සිංහල භාෂා දිනය
11. ප්‍රදර්ශන
12. සිංහල භාෂාව උදෙසා කැප වූ ප්‍රවීණයන් වෙනුවෙන් අනුස්මරණ දින පැවැත්වීම

## 6.0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම කර ගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ඇගයීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.

13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ.පො.ස. (උසස් පෙළ ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමුවරට 2011 වර්ෂයේ දී පැවැත්වේ.

මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.